ආහාර නිෂ්පාදන හා කෘෂිකාර්මික සංවර්ධන 2015.11.06

චක්‍රලේඛ අංක 01/2015

අමාත්‍යාංශ ලේකම්වරු
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලුම දිස්ත්‍රික් ලේකම් / දිසාපතිවරු
පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන 2016 - 2018**

**ආහාර භෝග නිෂ්පාදනය සහ කෘෂිකාර්මික සංවර්ධන සැලසුම ක්‍රියාත්මක කිරීම**

## 1. පසුබිම

ආහාර සුරක්ෂිතතාව සාක්ෂාත් කර ගැනීම, ගොවි ප්‍රජාවට ඉහළ මට්ටමේ තිරසාර ආදායම් ප්‍රභවයන් වර්ධනය කර දීම, පරිසර සංරක්ෂණය මෙන් ම ස්වාභාවික සම්පත් තිරසාරව කළමනාකරණය කිරීම, අන්තර් ජාතික වෙළඳපළේ තරඟකාරීත්වය වර්ධනය කිරීම වැනි බහුවිධ ඉලක්ක සපුරා ගැනීම අපේක්ෂා කරමින් අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි තුන් අවුරුදු ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන සම්පාදනය කරන ලදී.

එම වැඩසටහන යටතේ ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ නායකත්වයෙන් ආහාර භෝග නිෂ්පාදනය හා කෘෂිකාර්මික සංවර්ධන සැලසුම ක්‍රියාත්මක කරනු ලබයි. කෘෂි පාරිසරික කලාප පදනම් කර ගත් බෝග වගා ක්‍රමයක් ස්ථාපිත කරමින් හා නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ සියලු පාර්ශව අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් වඩාත් ඵලදායී කෘෂි කර්මාන්තයක් පවත්වාගෙන යාමට මෙම සංවර්ධන සැලැස්ම ඉවහල් වනු ඇත.

මෙම සැලසුම සකස් කිරීම සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල, ඇතුලත් රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය ඇතුළු කෘෂි අංශයේ ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පවත්වන ලදී. එමගින් ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන්, ක්‍රමෝපායන් හා වැඩසටහන් හඳුනා ගන්නා ලද අතර ඒ පිළිබඳව පූර්ණ විශ්ලේෂණයකින් පසුව ආහාර භෝග නිෂ්පාදනය සහ කෘෂිකාර්මික සංවර්ධන සැලසුම සකස් කරන ලදී.

### 1.1 ආහාර භෝග නිෂ්පාදනය සහ කෘෂිකාර්මික සංවර්ධන සැලසුමේ පරමාර්ථ

- දේශීය වශයෙන් නිෂ්පාදනය කළ හැකි ආහාර වලින් රට ස්වයංපෝෂණය කිරීම සහ ඒ මඟින් ආහාර ආනයනය සඳහා වැය වන විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරි කර ගැනීම
- ආහාර නිෂ්පාදනයේදී රසායනික පොහොර හා පළිබෝධනාශක භාවිතය අවම කොට පරිසර හිතකාමී ක්‍රම අනුගමනය කිරීම මගින් ගුණාත්මක ආහාර ද්‍රව්‍ය සුලභ කිරීම
- අතිරේක ආහාර සංචිත විධිමත්ව කළමනාකරණය කිරීම මඟින් ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම
- කෘෂි පාරිසරික කලාප පදනම් කර ගත් භෝග නිෂ්පාදන වැඩසටහනක් හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම
- නිෂ්පාදන කාර්යයේදී යෝග්‍ය තාක්ෂණික ක්‍රම භාවිතා කර නිෂ්පාදන ඵලදායීතාව ඉහළනැංවීම
- දේශීය ආහාර නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ සියළු ආයතන අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම හා පාසැල් ප්‍රජාව, සිවිල් සංවිධාන සහ මහජනතාවගේ එදිනෙදා ජීවිතයට මෙම වැඩසටහන බද්ධ කිරීම
- ආහාර නිෂ්පාදකයන් සඳහා ගුණාත්මක යෙදවුම් ලබා දීම සහ ඔවුන්ගේ නිෂ්පාදන සඳහා විධිමත් අලෙවිකරණ ක්‍රමවේද ඇති කිරීමට කටයුතු කිරීම

**1.2 ආහාර භෝග නිෂ්පාදනය සහ කෘෂිකාර්මික සංවර්ධන සැලසුමේ ප්‍රධාන අංශ**

මෙම සංවර්ධන සැලසුම ප්‍රධාන අංශ 2 ත් සමන්විත වේ.

I. ආහාර භෝග නිෂ්පාදනය හා ඵලදායීතාවය ඉහළ නැංවීම

මේ යටතේ වී සහ අතිරේක ආහාර බෝග වර්ග වන මුං, බඩ ඉරිඟු, රට කජු, සෝයා, ලොකු වැණු, මිරිස්, අර්තාපල්, කහ සහ ඉඟුරු, එළවළු සහ පළතුරු යන බෝග වර්ග වල නිෂ්පාදනය හා ඵලදායීතාවය ඉහළ නැංවීම හා ආනයනය අවම කිරීම ඉලක්ක කර ඇත. එසේම ගෙවතු වගාව ප්‍රචලිත කිරීම තුළින් ගෘහස්ථ නිෂ්පාදනය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ.

II. කෘෂිකාර්මික සංවර්ධනය

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය මුහුණ දී තිබෙන ප්‍රධාන ගැටළු විසඳීම සඳහා පියවර ගැනීම මෙමගින් බලාපොරොත්තු වේ. මෙම අංශය යටතේ යෙදවුම් කළමනාකරණය, ආහාර සුරක්ෂිතතාව, ස්වභාවික සම්පත් කළමනාකරණය හා දේශගුණ විපර්යාසවලට අනුවර්තනය වීම, පර්යේෂණ හා තාක්ෂණික සංවර්ධනය, අලෙවිකරණය, රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය, ගොවීන් සවිබල ගැන්වීම, තරුණ හා කාන්තා සහභාගීත්වය, දැනුම කළමනාකරණය, සාම්ප්‍රදායික දැනුම හා ක්‍රියාකාරකම්, පාරිභෝගික සෞඛ්‍ය හා තෘප්තිමත්භාවය, නෛතික හා නියාමන රාමුව, ආයතනික සම්බන්ධීකරණය, වාරිමාර්ග යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම යන ප්‍රධාන ක්ෂේත්‍ර හඳුනාගෙන ඇත.

## 2. ජාතික, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය භෝග නිෂ්පාදන ඉලක්ක

ආහාර භෝග නිෂ්පාදන ජාතික සැලසුම සකස් කිරීමේදී වී, අතිරේක ආහාර භෝග (මිරිස්, සෝයා, බඩ ඉරිඟු, මුං, රට කජු, කව්පි, තල, උඳු, කුරක්කන්, අර්තාපල්, ලොකු ළූණු, රතු ළූණු), එළවළු සහ පළතුරුවලට අදාළ භෝග නිෂ්පාදන ජාතික ඉලක්ක සකස් කර ඇත. එම ජාතික නිෂ්පාදන ඉලක්ක පාදක කර ගනිමින් පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් භෝග වගා ඉලක්ක තවදුරටත් හඳුනා ගන්නා ලදී. ඒ අනුව එක් එක් පළාතට, දිස්ත්‍රික්කයට හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාළව භෝග නිෂ්පාදන ඉලක්ක, එම ප්‍රදේශය තුළ එක් එක් භෝගයේ වගා වපසරිය සහ එමගින් අපේක්ෂිත අස්වැන්න තක්සේරු කර ගන්නා ලදී.

මෙම ජාතික, පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය මට්ටමේ සංඛ්‍යාත්මක ඉලක්ක සකස් කිරීම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් පළාත්, මහවැලි, අන්තර් පළාත්, ගොවිජන සේවා, වාරිමාර්ග යන ක්ෂේත්‍රවලට අදාළ විද්වතුන්ගේ සහභාගීත්වයෙන් සිදු කරන ලදි. ඒ අනුව සකස් කරන ලද ඉලක්ක ඇමුණුම 01 හි සඳහන් කර ඇත.

## 3. ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය

පළාත් සභා, මහවැලි අධිකාරිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙම වැඩසටහනට අදාළ සියලු ක්ෂේත්‍ර කටයුතු සිදු කළ යුතු වේ. දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් විසින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය වන පරිපාලනමය සම්බන්ධීකරණය හා අධීක්ෂණය සිදු කළ යුතු වේ. මෙහිදී මේ සමඟ වූ ඇමුණුමෙහි සඳහන් පළාත් හා දිස්ත්‍රික්ක/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීම අරමුණු කර ගනිමින් අවශ්‍ය සියලු ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සිදු වන බව වගබලාගත යුතුවේ. මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන ඉහත සඳහන් ආයතන හා ඊට අදාළ සහාය සේවාවන් සපයනු ලබන, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැනි ආයතන ඒකාබද්ධ ප්‍රවේශයක් ඔස්සේ සහයෝගීව කටයුතු කිරීම අනිවාර්ය වේ.

දිස්ත්‍රික් මට්ටමින් මෙම කටයුතු සාර්ථකව කිරීම සඳහා විවිධාංගීකරණය හා නවීකරණය කරන ලද කෘෂිකාර්මික පද්ධති ප්‍රවර්ධනය අරමුණු කර ගනිමින් දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම

ක්ෂේත්‍රයට සම්බන්ධ සියලුම පාර්ශවකරුවන්ගේ එකමුතුවෙන් දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් සකස් කර ගත යුතුය. මෙම කමිටුවෙහි සංයුතිය පහත පරිදි වේ.

සභාපති -දිස්ත්‍රික් ලේකම්
ලේකම් - දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ
සාමාජිකයන් - රාජ්‍ය නිලධාරීන්, පෞද්ගලික අංශයේ නිලධාරීන් රාජ්‍ය නොවන සංවිධානවල නිලධාරීන්, ගොවීන්

එම කමිටුව මගින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී මගපෙන්වීම සහ ඉලක්ක සපුරා ගැනීමට අදාළ පියවර ගැනීමට ක්‍රියා කළ යුතු වේ.

ප්‍රදේශයට අදාළ වූ ගොවිතැන් ක්‍රම පද්ධති මූලික කර ගනිමින් ඊට සම්බන්ධ සියලු ප්‍රාදේශීය පාර්ශවකරුවන්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය මට්ටමින් පත් කර ගත යුතු වේ. මෙම කමිටුවෙහි සංයුතිය පහත පරිදි වේ.

සභාපති - ප්‍රාදේශීය ලේකම්
ලේකම් - අධ්‍යක්ෂ (සැලසුම්)
සාමාජිකයන් - රාජ්‍ය නිලධාරීන්, පෞද්ගලික අංශයේ නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධානවල නිලධාරීන්, ගොවීන්

මෙම කමිටුවේ ප්‍රධාන කාර්ය භාරය පාරිසරික සුරක්ෂිතතාවය තහවුරු කර ගනිමින් හා ප්‍රාදේශීය නිෂ්පාදන විවිධාංගීකරණයක් ඇති කර ගත හැකි ආකාරයට වැඩසටහන මෙහෙයවීමයි.

## 4. නියාමනය, අධීක්ෂණය හා ප්‍රගති මෙහෙයුම්

### පළාත් මට්ටම

කෘෂිකර්ම අමාත්‍යතුමන්, පළාත් කෘෂිකර්ම අමාත්‍යවරුන්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්, පළාත් කෘෂිකර්ම ලේකම්වරුන්, වැඩසටහන මෙහෙයවනු ලබන හා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් මාස 03 ට වරක් මෙම වැඩසටහනේ ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කළ යුතුය. මෙම වැඩසටහනෙහි ජාතික හා පළාත් මට්ටමේ ප්‍රගතිය අතිගරු ජනාධිපතිතුමන්ගේ අධීක්ෂණයට ද නිරන්තරයෙන් ලබාදීමටද නියමිතය.

### දිස්ත්‍රික් මට්ටම

දිස්ත්‍රික්කයේ පිහිටුවා ගන්නා ලද දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව මගින් වැඩසටහනේ ප්‍රගතිය හා පසු විපරම් සිදු කළ යුතුය. ඒ අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී පැන නගිනු ලබන ගැටලු සඳහා සියලු පාර්ශව කරුවන්ගේ දායකත්වය තුළින් දිස්ත්‍රික්කය තුළ විසඳුම් සෙවීමට කටයුතු කළ යුතු වේ. වැඩසටහනේ ප්‍රගතිය කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත මාසිකව වාර්තා කළ යුතුය. මෙහිදී පැන නගින විශේෂ කරුණු, දිස්ත්‍රික් සංවර්ධන කමිටුව, දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව යන කමිටු වලදී සාකච්ඡාවට බඳුන් කළ යුතුය.

### ප්‍රාදේශීය මට්ටම

ප්‍රාදේශීය මට්ටමින් පිහිටුවා ගන්නා ලද ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුව මගින් වැඩසටහනේ ප්‍රගතිය හා පසු විපරම් සිදු කළ යුතුය. සෑම විටම ප්‍රාදේශීය මට්ටමේ තත්ත්වය පිළිබඳ දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව දැනුවත් කළ යුතු වේ. වැඩසටහනේ ප්‍රගතිය පිළිබඳ දිස්ත්‍රික් ලේකම් වෙත මාසිකව වාර්තා කළ යුතුය. මෙහිදී පැන නගින විශේෂ කරුණු, ප්‍රාදේශීය සංවර්ධන කමිටුව, ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුව හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව යන කමිටු වලදී සාකච්ඡාවට බඳුන් කළ යුතුය.

මෙම සැලසුම සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ විසින් ලබා දෙන සුවිශේෂී දායකත්වය අතිශයින් අගය කරමි.

බී.විජයරත්න
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය